# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1657/23 - 2010 ජුනි 09 වැනි බදාදා - 2010.06.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ කල්මුනේ මහ නගර සභාවේ සභිකයෙකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

පාර්ලිමේන්තුවට තේරී පත්වීම හේතු කොටගෙන කල්මුනේ මහ නගර සභාවේ සභිකයෙකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

2007 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධනය) පනතින් සංශෝධිත 65අ(2) වැනි වගන්තිය යටතේ ප්‍රතිපාදන සලසා ඇති පරිදි එච්. එම්. එම්. හරීස් නම් වූ සභිකයා අයත්වන ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30 ) ක කාල පරිච්ඡේදයක් ඇතුළත කල්මුනේ මහ නගර සභාවේ සභිකයෙකු වශයෙන් පත් කිරීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තෙකු නාමයෝජනා කිරීම, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන මීරා සාහිබු මුහම්මදු නිසාර් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කල්මුනේ මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරී එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා වන මම, ( 262 වැනි අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, මීරා සාහිබු මුහම්මදු නිසාර් මහතා කල්මුනේ මහ නගර සභාවේ සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා,<br>
තේරීම්භාර නිලධාරී,<br>
කල්මුනේ මහ නගර සභාව.

2010 මැයි මස 31 වැනි දින,<br>
අම්පාර,<br>
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දී ය,

06-543/1

1A - G 12958— 345 (2010/06)

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ කල්මුනේ මහ නගර සභාවේ නගරාධිපති ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පාර්ලිමේන්තුවට තේරී පත්වීම හේතු කොටගෙන කල්මුනේ මහ නගර සභාවේ නගරාධිපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය යටතේ නගරාධිපති වන එච්. එම්. එම්. හරීස් නම් වූ නගරාධිපති අයත් වන ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30 ) ක කාල පරිච්ඡේදයක් ඇතුළත නගරාධිපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත්වන්නා වූ ද, ඒ කල්මුනේ මහ නගර සභාවේ සභිකයා පිළිබඳ තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සෙයියට් සෙයින් මොහම්මඩ් මසූර් මවුලානා මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

කල්මුනේ මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරී එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා වන මම, ( 262 වැනි අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, සෙයියට් සෙයින් මොහම්මඩ් මසූර් මවුලානා මහතා කල්මුනේ මහ නගර සභාවේ නගරාධිපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා,
තේරීම්භාර නිලධාරී,
කල්මුනේ මහ නගර සභාව.

2010 මැයි මස 31 වැනි දින,
අම්පාර,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දී ය.

06-543/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.